2. If the sentence is by its nature or duration incompatible with the laws of the Receiving Party, that Party may adapt the sentence in accordance with the sentence prescribed by its own law for a similar offence. When adapting the sentence, the appropriate authorities of the Receiving Party shall be bound by the findings of fact, insofar as they appear from any opinion, conviction, judgment, or sentence imposed in the Transferring Party. The adapted sentence shall be no more severe than that imposed by the Transferring Party in terms of nature or duration, nor exceed the maximum penalty prescribed by the law of the Receiving Party. When adapting the sentence, the competent authority of the Receiving Party may, however, not convert a sentence of imprisonment to a pecuniary sanction.

ARTICLE 9

Effect of Completion of Sentence on the Transferring Party

When the Receiving Party notifies the Transferring Party under paragraph 1 (a) of Article 12 of this Treaty that the sentence has been completed, such notification shall have the effect of discharging the sentence of the sentenced person in the Transferring Party.

ARTICLE 10

Review of Judgment and Pardon, Amnesty or Commutation

1. The Transferring Party alone shall decide on any application for review of the judgment.

2. The Transferring Party or the Receiving Party may grant pardon, amnesty or commutation of the sentence in accordance with its Constitution and other laws.

ARTICLE 11

Termination of Enforcement of Sentence

1. The Transferring Party shall as soon as practicable notify the Receiving Party of any decision taken in its territory which entails terminating the enforcement of the sentence or part thereof.

2. The Receiving Party shall terminate enforcement of the sentence or part thereof as soon as it is informed by the Transferring Party of any decision or measure as a result of which the sentence ceases to be enforceable.

ARTICLE 12

Information on Enforcement of Sentence

1. The Receiving Party shall notify the Transferring Party:

(a) when the enforcement of the sentence has been completed; or

(b) if the sentenced person escapes from custody or dies before enforcement of the sentence has been completed. In the case of an escape of the prisoner, the Receiving Party shall take measures to secure his/her arrest and to render him/her liable for escaping under the relevant laws of the Receiving Party.

2. The Receiving Party shall furnish a special report concerning the enforcement of the sentence, if so required by the Transferring Party.

ARTICLE 13

Transit

1. If either Party enters into any arrangement for the transfer of sentenced persons with any third State, the other Party shall, in accordance with its laws, cooperate in facilitating as soon as practicable the transit through its territory of the sentenced person(s) being transferred pursuant to such arrangement. The Party intending to make such a transfer shall give advance notice to the other Party of such transit.

2. Each Party may refuse to grant transit:

(a) if the sentenced person is one of its own citizens.

(b) if the request may infringe upon the sovereignty, national security, public order or any other essential interest of the Party.

ARTICLE 14

Costs

Any cost incurred in relation to the transfer of the sentenced person or the continued enforcement of the sentence after transfer shall be borne by the Receiving Party, except costs incurred by the Transferring Party exclusively within the territory of the Transferring Party. The Receiving Party may, however, seek to recover all or a part of the costs of transfer from the sentenced person or some other source.

ARTICLE 15

Language

Requests and supporting documents shall be furnished in English or shall be accompanied by a certified translation into English.

ARTICLE 16

Obligations under other International Agreements

This Treaty shall not affect the rights or obligations of the Parties under other international Agreements or other Agreements to which they are a party.

ARTICLE 17

Settlement of Disputes

1. The Central Authorities shall endeavour to mutually resolve any dispute arising out of the interpretation, application or implementation of this Treaty.

2. If the Central Authorities are unable to resolve the dispute mutually, it shall be resolved through diplomatic channels.

ARTICLE 18

Handing Over of Sentenced Persons

1. The handing over of the sentenced person by the Transferring Party to the Receiving Party shall occur at a place and time to be agreed upon between the Parties. The Receiving Party shall be responsible for the transfer of the prisoner from the Transferring Party and shall also be responsible for custody of the sentenced person outside the territory of the Transferring Party.

2. The handing over of the sentenced person shall be made in writing in duplicate in the English language.

ARTICLE 19

Amendments

Any amendment or modification to this Treaty agreed to by the Parties shall come into force in the same manner as the Treaty itself.

ARTICLE 20

Final Provisions

1. This Treaty shall be subject to ratification under the laws of each Party. Each Party shall notify the other as soon as practicable, in writing, through diplomatic channels, upon the completion of its legal procedures required for the entry into force of this Treaty. The Treaty shall come into force on the first day of the second month of the date of the last notification.

2. The Treaty shall remain in force for an indefinite period. It may, however, be terminated by either of the Parties giving a written notice of termination to other Party. The termination shall come into effect six (06) months after the date on which such notice is received by the other Party.

3. Notwithstanding any termination, this Treaty shall continue to apply to the requests for the transfer of sentenced persons made before the date on which such termination comes into effect.

IN WITNESS WHEREOF, the undersigned, being duly authorized by their respective States, have signed this Treaty.

Done in duplicate at Colombo on the 7th day of April 2014, in the Vietnamese, Sinhala and English languages, all texts being equally authentic. In case of any divergence of interpretation, the English text shall prevail.

FOR THE SOCIALIST REPUBLIC OF VIET NAM	FOR THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA
GENERAL TRAN DAI QUANG MINISTER OF PUBLIC SECURITY	HON. RAUF HAKEEM MINISTER OF JUSTICE

දඬුවම් විඳින තැනැත්තන් භාරදීම

සඳහා

වියට්නාම සමාජවාදී ජනරජය අතර

සහ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ඇතිකර ගන්නා

ගිවිසුම

දඬුවම් විදින තැනැත්තන් භාරදීම සඳහා වියට්නාම සමාජවාදී ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර ඇතිකර ගන්නා ගිවිසුම

විදේශ රටක දඬුවම් විඳින තැනැත්තන්ගේ සමාජීය පුනරුත්ථාපනය ඔවුන්ගේ මව් රට තුළ දී ඉටුකිරීමට පහසුකම් සැලසීමේ අපේක්ෂාවෙන් ද;

වරදක් සිදු කරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වරදකරු කොට, දඬුවම් පමුණුවා, විදේශ රටක දඬුවම් විඳින තැනැත්තන් වෙත ඔවුන්ගේ දඬුවම් කාලය තම මව් රට තුළ විඳීමේ අවස්ථාව ලබාදීම මඟින් යථෝක්ත අරමුණ සාක්ෂාත් කර ගත යුතු බව සැලකිල්ලට භාජනය කරමින් ද;

වියට්නාම සමාජවාදී ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (මෙහි මින් මතු තනි තනිව *පාර්ශ්වකරු* වශයෙන් ද සාමූහිකව *පාර්ශ්වකරුවන්* වශයෙන් ද හඳුන්වනු ලබන,) විසින් එකඟ වූ වග මෙසේ ය.

1 වන වගන්තිය

අර්ථ නිරූපණය

මෙම ගිවිසුමේ කාර්ය සඳහා,

(අ) "නඩු තීන්දුව" යන්නෙන් දණ්ඩන නියමයක් පමුණුවමින් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් කරන තීරණයක් හෝ නියෝගයක් අදහස් වේ.

(ආ) "භාරදීම ලබන පාර්ශ්වය" යන්නෙන් සම්පූර්ණ දණ්ඩන නියමය හෝ ඒ දණ්ඩන නියමයේ ඉතිරි දඬුවම් කාලය විඳීම පිණිස දඬුවම් විඳින තැනැත්තා භාරදීම ලැබිය හැකි හෝ භාරදීම දීම ලැබී ඇති රාජ්‍යය අදහස් වේ.

(ඇ) "භාරදීම කරන පාර්ශ්වය" යන්නෙන් දණ්ඩන නියමය විඳින තැනැත්තා භාරදීම කරනු ලැබිය හැකි හෝ භාරදීම සිදු කර ඇති පාර්ශ්වය අදහස් වේ.

(ඈ) "දණ්ඩනය නියමය" යන්නෙන් යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් සිය අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් යම් නිශ්චිත කාලසීමාවක් සඳහා හෝ ජීවිතාන්තය දක්වා පනවන සිර දඬුවමක් අදහස් වේ.

(ඉ) "දඬුවම් විඳින තැනැත්තා" යන්නෙන් පාර්ශ්වකරුවන්ගේ රාජ්‍යයන්හි තක්කාලයේ බලපවත්නා නීතිය යටතේ ස්ථාපිත කර ඇති අධිකරණයක් මඟින් පනවන නඩු තීන්දුවක් ප්‍රකාරව සිරගත කිරීමකින් දණ්ඩන නියමයක් විඳින තැනැත්තකු අදහස් වේ.

2 වන වගන්තිය

පොදු මූලධර්ම

(1) දඬුවම් විඳින තැනැත්තන්, මෙම ගිවිසුමේ ඇතුළත් විධිවිධාන සහ එක් එක් පාර්ශ්වයේ ජාතික නීතිය අනුව, භාරදීම සම්බන්ධයෙන් පාර්ශවකරුවන් විසින් ඒ අනෙක් පාර්ශ්වය වෙත පෘථුල සහයෝගිතාව දැක්විය යුතුය.

(2) යම් පාර්ශ්වයක දේශ සීමාවක දී දඬුවම් විඳින තැනැත්තකු වෙත පනවා ඇති ඒ දණ්ඩන නියමය සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් විඳීම සඳහා, මෙම ගිවිසුම යටතේ ඒ තැනැත්තා ඒ පාර්ශ්වයේ දේශ සීමාවේ සිට ඒ අනෙක් පාර්ශ්වයේ දේශ සීමාව වෙත භාරදීම කළ හැකිය. මෙම කාර්ය සඳහා ඒ දඬුවම් විඳින තැනැත්තා එවැනි භාරදීමක් සඳහා තම මනාපය ප්‍රකාශ කළ යුතුය.

(3) යම් තැනැත්තකු භාරදීම සම්බන්ධයෙන් කරන ඉල්ලීමක් එක් පාර්ශ්වයක පුරවැසිභාවය හිමි දඬුවම් විඳින තැනැත්තකු විසින් හෝ ඒ දඬුවම් විඳින තැනැත්තා වෙනුවෙන් ක්‍රියා කිරීමට හිමිකමක් ඇති සහ ඒ පාර්ශ්වයේ පුරවැසිභාවය හිමි තැනැත්තකුට ඒ පාර්ශයේ නීතිය අනුව ඒ අනෙක් පාර්ශ්වය වෙත අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම මඟින් කළ හැකිය.

(4) දඬුවම් විඳින තැනැත්තකු භාරදීමට කරන ඉල්ලීමක් භාරදීම කරන පාර්ශ්වය හෝ භාරදීම ලබන පාර්ශ්වය විසින් ද කළ හැකිය.

3 වන වගන්තිය

මධ්‍යම බලධාරීන්

(1) මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා එක් එක් පාර්ශ්වය විසින් මධ්‍යම බලධාරියකු නම් කළ යුතුය.

(2) මෙම ගිවිසුම ක්‍රියාත්මක කිරීම භාරව සිටින පාර්ශ්වකරුවන්ගේ මධ්‍යම බලධාරීන් මෙසේ ය.

- වියට්නාම සමාජවාදී ජනරජය වෙනුවෙන් - මහජන ආරක්ෂක අමාත්‍යාංශය.
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් - අධිකරණ විෂය භාර අමාත්‍යාංශය.

(3) එක් එක් පාර්ශ්වය අදාළ මධ්‍යම බලධාරියා සම්බන්ධයෙන් සිදුවන යම් වෙනස්වීමක් ඒ අනෙක් පාර්ශ්වය වෙත රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් වහාම දැනුම් දිය යුතුය.

(4) මෙම ගිවිසුම යටතේ අන්‍යාකාරයකින් විධිවිධාන සැලසීම අවශ්‍ය වන්නේ නම් මිස, මෙම ගිවිසුමේ කාර්ය සඳහා මධ්‍යම බලධාරීන් විසින් සෘජුව ම අදහස් හුවමාරු කරගනු ලැබිය හැකිය.

4 වන වගන්තිය

හුවමාරු කිරීමේ කොන්දේසි

(1) දඬුවම් විඳින තැනැත්තකු පහත සඳහන් කොන්දේසි මත මෙම ගිවිසුම යටතේ භාරදීම කළ හැකිය.

(අ) දඬුවම් විඳින තැනැත්තා භාරදීම ලබන පාර්ශ්වයේ පුරවැසියකු වීම

(ආ) නඩු කීන්දුව අවසානාත්මක වීම සහ දඬුවම් විඳින තැනැත්තාට එරෙහිව භාරදීම කරන පාර්ශ්වය

තුළ විභාග වෙමින් පවතින වෙනත් නඩු කටයුතු නොමැති වීම.

(ඇ) දඬුවම් විදින තැනැත්තා යුධමය වැරදි සම්බන්ධයෙන් වූ වරදකට වරදකරුවකු නොවීම.

(ඈ) භාරදීම සඳහා ඉල්ලීමක් ලබන අවස්ථාව වන විට දඬුවම් විදින තැනැත්තා විසින් විඳිය යුතු දඬුවම් කාලය අඩු තරමින් තවත් මාස 6 ක් තිබීම හෝ ජීවිතාන්තය දක්වා සිර දඬුවමකට යටත් වීම.

(ඉ) දණ්ඩනය පනවා ඇති ක්‍රියාවන් කිරීම හෝ නොකරහැරීම් තුළ භාරදීම ලබන පාර්ශ්වයේ නීති යටතේ අපරාධ වරදක් සංයුක්ත වීම; මෙම කොන්දේසිය දෙපාර්ශ්වයේ නීතිවල විස්තර කරන වරද, ඒ වරදේ අත්‍යාවශ්‍ය ස්වභාවයට බලනොපාන කාරණාවක් සම්බන්ධයෙන් සර්ව සම වන බවට නියම කිරීමට අර්ථ නිරූපණය නොකළ යුතුය.

(ඊ) දඬුවම් විදින තැනැත්තන් භාර කර ගැනීම මඟින් පාර්ශ්වකරුවන්ගේ රාජ්‍යයන්හි ස්වෛරීභාවයට, ජාතික ආරක්ෂාවට හෝ වෙනත් යම් අත්‍යාවශ්‍ය පරමාර්ථයන්ට අගතියක් නොවිය යුතුය.

(උ) භාරදීම ඉටුකිරීම සඳහා දඬුවම් විදින තැනැත්තා විසින් කැමැත්ත ලබාදීම හෝ ඔහුගේ/ ඇයගේ වයස, ශාරීරික හෝ මානසික තත්ත්වය නිසා ඒ පාර්ශ්වයේ ජාතික නීති අනුව ඔහු / ඇය වෙනුවෙන් ක්‍රියා කිරීමට හිමිකම් ඇති වෙනත් යම් තැනැත්තකු විසින් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීම අවශ්‍ය බව දෙපාර්ශ්වයෙන් යම් කවර ම වූ එක් පාර්ශ්වයක් විසින් සැලකීම.

(ඌ) භාරදීම කරන පාර්ශ්වය සහ භාරදීම ලබන පාර්ශ්වය විසින් එකී භාරදීම සඳහා එකඟ විය යුතුය.

2. දඬුවම් විදින තැනැත්තාට භාරදීම ලබන පාර්ශ්වයේ දී වධ හිංසා හෝ කෲර අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නොහොත් දඬුවමකට යටත් කරන බවට විශ්වාස කිරීමට හේතු තිබෙන බවට භාරදීම කරන පාර්ශ්වයේ මතය වන විට, දඬුවම් විදින තැනැත්තා භාරදීම සඳහා කරන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කළ හැකිය.

5 වන වගන්තිය

භාරදීමේ කාර්ය පටිපාටිය

(1) පාර්ශ්වකරුවන් විසින් මෙම ගිවිසුමේ හරය දඬුවම් විදින තැනැත්තන්ට දැන්වීමට උත්සාහ ගත යුතුය.

(2) දඬුවම් විදින තැනැත්තා තමන් භාරදීම කරන ලෙස තම කැමැත්ත භාරදීම කරන පාර්ශ්වයට ප්‍රකාශ කරන්නේ නම්, සහ භාරදීම කරන පාර්ශ්වය මූලික වශයෙන් භාරදීම සඳහා වන එම ඉල්ලීම අනුමත කිරීමට සූදානම් නම්, භාරදීම කරන පාර්ශ්වය විසින් ඒ බව පහත සඳහන් තොරතුරු ඇතුළත් ලියවිල්ලකින් භාරදීම ලබන පාර්ශ්වයට වහාම දැන්විය යුතුය.

(අ) දඩුවම් විඳින තැනැත්තාගේ නම, පුරවසිභාවය, උපන් දිනය හා උපන් ස්ථානය සහ භාරදීම ලබන පාර්ශ්වයේ දී අවසන් වරට දන්නා ඔහු /ඇය සිටි ස්ථානය හෝ ස්ථිර පදිංචි ලිපිනය (තිබේ නම් පමණක්) හා ඔහුගේ /ඇයගේ ගමන් බලපත්‍රය හෝ අනන්‍යතාව ඔප්පු කළ හැකි වෙනත් යම් පෞද්ගලික ලියකියවිලි සහ හැකිනම් ඒ දඩුවම් විඳින තැනැත්තාගේ ඇඟිලි සලකුණු.

(ආ) වරදකරු කිරීම හා දඩුවම් පැමිණවීම පදනම් කරගත් කරුණු ඇතුලත් ප්‍රකාශයක්.

(ඇ) දණ්ඩන නියමයේ ස්වභාවය, දණ්ඩන නියමයේ කාලසීමාව හා ආරම්භ වන දිනය, (අදාළ වේ නම් දණ්ඩන නියමය අවසන් වන දිනය) දඩුවම් විඳින තැනැත්තා මේ දක්වා දඩුවම් විඳ ඇති කාලසීමාව, ඔහු හෝ ඇය සිරගතව සිටිය දී කළ වැඩ, යහපත් හැසිරීම, නඩු විභාගයට පෙර රඳවා තබාගත් කාලය, හෝ වෙනත් හේතු මත ඔහුට / ඇයට හිමිකම් ඇති දඩුවම් ලිහිල් කිරීමක් පිළිබඳ විස්තර.

(ඈ) නඩු තීන්දුවේ සහතික කළ පිටපතක් සහ දඩුවම් විඳින තැනැත්තාට එරෙහිව නියම කරන ලද දණ්ඩන නියමයට පාදක කරගත් අදාළ නෛතික විධිවිධානවල පිටපතක්.

(ඉ) දඩුවම් විඳින තැනැත්තාගේ අයදුම් පත්‍රය පිළිබඳව සුදුස්සක් කිරීම සම්බන්ධයෙන් හෝ ඔහු / ඇය රඳවා තබා ගැනීම තීරණය කිරීම් සම්බන්ධයෙන් අදාළ වන ඒ දඩුවම් විඳින තැනැත්තාගේ පූර්ව ක්‍රියා කලාපය සහ චරිතය සම්බන්ධ වෛද්‍ය, සමාජීය හෝ වෙන යම් වාර්තාවක් (තිබේ නම්)

(ඊ) භාරදීම ඉටුකිරීමේ හැකියාව සලකා බැලීමට භාරදීම ලබන පාර්ශ්වයට හැකිවන බවට හා ඒ භාරදීම ලබන පාර්ශ්වයේ නීති යටතේ ඒ දඩුවම් විඳින තැනැත්තා භාරදීම ඉටුකර ගැනීමේ සම්පූර්ණ ප්‍රතිඵලය ඔහුට හෝ ඇයට දැනුම් දීමට ඒ භාරදීම ලබන පාර්ශ්වයට හැකිවන බවට අවශ්‍ය යයි නියම කරන වෙනත් යම් තොරතුරු.

(උ) භාරදීම ඉටුකරවා ගැනීමට දඩුවම් විඳින තැනැත්තා විසින් කරන හෝ භාරදීම කරන පාර්ශ්වයේ නීතිවලට අනුකූලව ඔහු / ඇය වෙනුවෙන් ක්‍රියා කිරීමට හිමිකම් ඇති තැනැත්තකු විසින් කරන ඉල්ලීම.

(3) භාරදීම ඉටුකරන ලෙස දඩුවම් විඳින තැනැත්තකු විසින් සිය කැමැත්ත භාරදීම ලබන පාර්ශ්වයට පළ කරන්නේ නම්, භාරදීම කරන පාර්ශ්වයට එම භාරදීම ඉටුකිරීම එපරිදි දැනුම් දිය යුතුය. භාරදීම ඉටුකිරීම පිණිස කරන ඉල්ලීම මූලික වශයෙන් අනුමත කිරීමට භාරදීම කරන පාර්ශ්වය සූදානම් වන්නේ නම් මෙම ව්‍යවස්ථාවේ 2 වන ඡේදයේ සඳහන් තොරතුරු භාරදීම කරන පාර්ශ්වය විසින් භාරදීම ලබන පාර්ශ්වය වෙත වහාම සැපයිය යුතුය.

(4) භාරදීම ලබන පාර්ශ්වය භාරදීම කරන පාර්ශ්වයේ ඇති තොරතුරු සලකා බැලීමෙන් පසුව, භාරදීම ඉටුකිරීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරගෙන යාමට සිය කැමැත්ත දක්වන්නේ නම්, ඒ බව භාරදීම කරන පාර්ශ්වයට ලිඛිතව වහාම දැනුම් දී පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය.

(අ) දඬුවම් විඳින තැනැත්තා මෙම ගිවිසුමේ කාර්ය සඳහා භාරදීම ලබන පාර්ශ්වයේ පුරවැසියකු වන බවට පිළිබිඹු කරන ප්‍රකාශයක්.

(ආ) භාරදීම කරන පාර්ශ්වයේ දී එකී දණ්ඩන නියමය පැනවීමට පාදක වූ ක්‍රියාවන් හෝ නොකරහැරීම් භාරදීම ලබන පාර්ශ්වයේ නීතිය අනුව අපරාධ වරදක් සංයුක්ත වන බවට සහ ඒ ක්‍රියාවන් හෝ නොකරහැරීම් භාරදීම ලබන පාර්ශ්වයේ දේශ සීමාව තුළ දී කළහොත් අපරාධ වරදක් සංයුක්ත වන බවට විධිවිධාන සලසන, භාරදීම ලබන පාර්ශ්වයේ අදාළ නීතියේ පිටපතක්.

(ඇ) දඬුවම් විඳින තැනැත්තා භාරදීමෙන් පසුව භාරදීම ලබන පාර්ශ්වයේ දී ඒ තැනැත්තා රඳවා තබා ගැනීම හා සම්බන්ධ ඒ තැනැත්තාට බලපාන යම් නීතිය හෝ රෙගුලාසියක බලපෑම සම්බන්ධ ප්‍රකාශනයක්, හා අදාළ වේ නම්, ඒ තැනැත්තා භාරදීමෙන් පසුව මෙම ගිවිසුමේ 8 වන වගන්තියේ 2 වන ඡේදයේ බලපෑම දැක්වෙන ප්‍රකාශයක්.

(ඈ) දඬුවම් විඳින තැනැත්තකු භාරදීම පිළිගැනීමට භාරදීම ලබන පාර්ශ්වය දක්වන කැමැත්ත සහ දඬුවම් විඳින තැනැත්තාගේ ඉතිරි වූ දඬුවම් කාලය පරිපාලනය කිරීමට බාර ගැනීම.

(ඉ) භාරදීම කරන පාර්ශ්වය අවශ්‍ය යයි සලකන යම් වෙනත් තොරතුරු හෝ ලේඛන.

(5) භාරදීම කරන පාර්ශ්වය විසින් භාරදීම සම්බන්ධ ඉදිරි කටයුතු කරගෙන යාමට සිය කැමැත්ත පළකරන්නේ නම්, ඒ බව සඳහන් කරමින් භාරදීම ලබන පාර්ශ්වයට වහාම පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය.

(අ) භාරදීම සඳහා දඬුවම් විඳින තැනැත්තාගේ කැමැත්ත ඇතුළත් ප්‍රකාශයක්.

(ආ) භාරදීම සඳහා භාරදීම කරන පාර්ශ්වයේ මනාපය සනාථ කෙරෙන ලිඛිත ප්‍රකාශයක්.

(6) භාරදීම ඉටුකිරීම සඳහා පාර්ශ්වකරුවන් එකඟ වී ඇති විටක, දඬුවම් විඳින තැනැත්තා භාරදීම සඳහා ඔවුන් විසින් කටයුතු සූදානම් කළ යුතුය. භාරදීම කරන පාර්ශ්වයේ නිසි බලධාරීන් විසින් භාරදීම ලබන පාර්ශ්වයේ නිසි බලධාරීන් වෙත ඒ දඬුවම් විඳින තැනැත්තා භාරදීම, දෙපාර්ශ්වය විසින් එකඟ වන භාරදීම කරන පාර්ශ්වයේ දේශසීමාව තුළ යම් දිනයක දී යම් ස්ථානයක දී සිදුවිය යුතුය.

(7) දෙපාර්ශ්වයෙන් යම් කවර ම වූ පාර්ශ්වයක් භාරදීම සඳහා එකඟ නොවීමට තීරණය කරන්නේ නම්, ඒ පාර්ශ්වයේ තීරණය ඒ අනෙක් පාර්ශ්වයට වහාම ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

(8) මෙම වගන්තියේ විධිවිධාන ප්‍රකාරව භාරදීම කරන පාර්ශ්වය හෝ භාරදීම ලබන පාර්ශ්වය විසින් ගනු ලබන යම් කවර ම වූ ක්‍රියාමාර්ගයක් භාරදීම කරන පාර්ශ්වය විසින් දඬුවම් විදින තැනැත්තාට දැනුම් දිය යුතුය.

6 වන වගන්තිය

කැමැත්ත තහවුරු කර ගැනීම

(1) මෙම ගිවිසුමේ 4 වන වගන්තියේ 1(ජී) ඡේදයට අනුව භාරදීම ඉටුකිරීම පිණිස දඬුවම් විදින තැනැත්තකු විසින් දීමට නියම කරන කැමැත්ත ස්වේච්ඡාවෙන් නොකරන එහි අඩංගු නෛතික ප්‍රතිඵලයන් පිළිබඳ මනා දැනීමකින් සහිතව ඉදිරිපත් කරන කැමැත්තක් බවට භාරදීම කරන පාර්ශ්වය විසින් සහතික කරගත යුතුය. එවැනි කැමැත්තක් පළකිරීමේ කාර්ය පටිපාටිය භාරදීම කරන පාර්ශ්වයේ නීතිය මඟින් පාලනය විය යුතුය.

(2) මෙම වගන්තියේ 1 වන ඡේදයේ දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව කැමැත්ත ප්‍රකාශ කර තිබේ ද යන්න භාරදීම ලබන පාර්ශ්වයට තහවුරු කර ගැනීමට අවස්ථාවක් භාරදීම කරන පාර්ශ්වය විසින් සලසා දිය යුතුය.

7 වන වගන්තිය

භාරදීම ඉටුකිරීම භාරදීම ලබන පාර්ශ්වයට බලපාන ආකාරය

(1) භාරදීම ලබන පාර්ශ්වය විසින් දණ්ඩන නියමය බලාත්මක කිරීම, භාරදීම ලබන පාර්ශ්වයේ ජාතික නීති අනුව හා මෙම ගිවිසුමේ 8 වන වගන්තියේ දක්වා ඇති කොන්දේසිවලට යටත්ව නියම කරනු ලැබිය හැකි පරිදි අධිකරණ නියෝගයක් හෝ පරිපාලන ආඥාවක් හරහා අඛණ්ඩව ම සිදුවිය යුතුය.

(2) දණ්ඩන නියමය බලාත්මක කිරීම, මෙම ගිවිසුමේ 10 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, භාරදීම ලබන පාර්ශ්වයේ නීති මඟින් පාලනය විය යුතු අතර, එම පාර්ශ්වය සුදුසු සියලුම තීරණ ගැනීම සම්බන්ධයෙන් තනි නිසි බලධාරී විය යුතුය.

8 වන වගන්තිය

දණ්ඩන නියමය අඛණ්ඩවම බලාත්මක කිරීම

(1) භාරදීම කරන පාර්ශ්වය විසින් තීරණය කරන දණ්ඩන නියමයේ නෛතික ස්වභාවය සහ දණ්ඩන නියමයේ කාලසීමාව මඟින් භාරදීම ලබන පාර්ශ්වය බැඳී සිටිය යුතුය.

(2) යම් දණ්ඩන නියමයක් ඒ දණ්ඩන නියමයේ ස්වභාවය සහ කාලසීමාව අනුව භාරදීම ලබන පාර්ශ්වයේ නීතිවලට පරස්පර විරෝධී නම්, ඒ පාර්ශ්වයට ඒ දණ්ඩන නියමය ඒ පාර්ශ්වයේ නීතිය මඟින් ඊට සමාන වරදකට නියම කර ඇති දණ්ඩනයට අනුව සුදුසු පරිදි සකස් කරගත හැකිය. එලෙස දණ්ඩන නියමයන් සුදුසු පරිදි සකස් කර ගැනීමේ දී භාරදීම ලබන පාර්ශ්වයේ මතය, වරදකරු කිරීම, නඩු තීන්දුව හෝ පනවන දණ්ඩනය මඟින් පෙනී යන තාක් දුරට අන්තර්ගත කරන කරුණු පිළිබඳ තීරණ මඟින් එකී භාරදීම ලබන පාර්ශ්වය අනුගමනය විය යුතුය. සුදුසු පරිදි සකස් කරගන්නා දණ්ඩන නියමයේ ස්වභාවය සහ කාලය සම්බන්ධයෙන් භාරදීම කරන

පාර්ශ්වය විසින් පනවන දණ්ඩනයට වඩා බරපතළ නොවිය යුතු අතර, භාරදීම ලබන පාර්ශ්වයේ නීති මඟින් නියම කරන උපරිම දඩුවම ඉක්ම නොවිය යුතුය. එමෙන් ම දණ්ඩන නියමය සුදුසු පරිදි සකස් කිරීමේ දී ඒ භාරදීම ලබන පාර්ශ්වයේ නිසි බලධාරියා විසින් සිරගත කිරීමේ දඩුවමක් මූල්‍යමය තහනමක් බවට කෙසේ වුව ද පරිවර්තනය නොකළ යුතුය.

9 වන වගන්තිය

භාරදීම කරන පාර්ශ්වයේ දී දණ්ඩන නියමය සම්පූර්ණ කිරීමේ ප්‍රතිඵලය

දණ්ඩන නියමය සම්පූර්ණයෙන් විඳ ඇති බව, මෙම ගිවිසුමේ 12 වගන්තියේ 1(අ) ඡේදය යටතේ, භාරදීම ලබන පාර්ශ්වය විසින් භාරදීම කරන පාර්ශ්වයට දැනුම් දෙන අවස්ථාවක දී දඩුවම් විඳින තැනැත්තාට අදාළ දණ්ඩන නියමයෙන් ඒ තැනැත්තා භාරදීම කරන පාර්ශ්වයේ දී නිදහස් වන බවට එකී දැන්වීමේ ප්‍රතිඵලය විය යුතුය.

10 වන වගන්තිය

නඩු කීන්දුව සමාලෝචනය කිරීම සහ සමාව,

පොදු සමාව හෝ දඩුවම ලිහිල් කිරීම

(1) භාරදීම කරන පාර්ශ්වය පමණක් යම් ඉල්ලීමක් මත නඩු කීන්දුව සමාලෝචනය කිරීම පිළිබඳ තීරණය කළ යුතුය.

(2) භාරදීම කරන පාර්ශ්වය හෝ භාරදීම ලබන පාර්ශ්වය දෙරටේ පවත්නා ව්‍යවස්ථාව සහ වෙනත් නීතිවලට අනුකූලව දණ්ඩන නියමය සලකා සමාව ලබාදීම, පොදු සමාව ලබාදීම හෝ දණ්ඩනය ලිහිල් කිරීම හෝ සිදු කළ හැකිය.

11 වන වගන්තිය

දණ්ඩන නියමය බලාත්මක කිරීම අවසාන කිරීම

(1) භාරදීම කරන පාර්ශ්වය දණ්ඩන නියමය හෝ ඉන් කොටසක් සිය දේශසීමාව තුළ දී බලාත්මක කිරීම අවසාන කරමින් ගන්නා යම් තීරණයක් භාරදීම ලබන පාර්ශ්වයට වහාම දැනුම් දිය යුතුය.

(2) දණ්ඩන නියමය බලාත්මකව පැවතීම නතර වීමේ ප්‍රතිඵලයක් වශයෙන් භාරදීම කරන පාර්ශ්වය විසින් එළඹී ඇති යම් තීරණයක් හෝ ගෙන ඇති යම් පියවරක් පිළිබඳව ඒ පාර්ශ්වය විසින් දැනුම් දුන් වහාම භාරදීම ලබන පාර්ශ්වය විසින් දණ්ඩන නියමය හෝ ඉන් කොටසක් බලාත්මක කිරීම අවසාන කළ යුතුය.

12 වන වගන්තිය

දණ්ඩන නියමය බලාත්මක කිරීම පිළිබඳ තොරතුරු

(1) භාරදීම ලබන පාර්ශ්වය විසින්,

(අ) දණ්ඩන නියමය ක්‍රියාත්මක වීම සම්පූර්ණ වී තිබෙන අවස්ථාවක දී ; හෝ

(ආ) දඩුවම් විඳින තැනැත්තා සිරභාරයෙන් පැනයාම හෝ දණ්ඩන නියමය ක්‍රියාත්මක වීම සම්පූර්ණ වීමට පෙර මිය යාම සිදු වුවහොත් භාරදීම කරන පාර්ශ්වය වෙත දැනුම් දිය යුතුය.

සිරකරුවකු පැන යාම සිදු වූ අවස්ථාවක දී, භාරදීම ලබන පාර්ශ්වය ඔහු / ඇය සිරභාරයට ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර, ඒ පැන යාම සඳහා ඔහුට / ඇයට එරෙහිව භාරදීම ලබන පාර්ශ්වයේ අදාළ නීති යටතේ නිත්‍යානුකූල පියවර ගත යුතුය.

(2) දණ්ඩන නියමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ වාර්තාවක් ලබාදෙන ලෙසට භාරදීම කරන පාර්ශ්වය විසින් නියම කළ විට, ඒ වාර්තාව භාරදීම ලබන පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ යුතුය.

13 වන වගන්තිය

දේශ සීමා පසුකර යාම

(1) දෙපාර්ශ්වයෙන් යම් කවර ම වූ එක් පාර්ශ්වයක් දඩුවම් විඳින තැනැත්තන් තෙවැනි රාජ්‍යයක් සමඟ භාරදීමේ ක්‍රියා පිළිවෙතකට එළඹී සිටින්නේ නම්, ඒ අනෙක් පාර්ශ්වය, ඒ පාර්ශ්වයේ නීතිවලට අනුකූලව

එකී ක්‍රියා පිළිවෙත ප්‍රකාරව භාරදීම කරන ඒ දඩුවම් විඳින තැනැත්තා / තැනැත්තන් ඒ දේශ සීමාව හරහා භාරදීම පිණිස ප්‍රායෝගිකව හැකි ඉක්මණින් පහසුකම් සලසමින් උපකාර කළ යුතුය. එවැනි භාරදීමක් කිරීමට අදහස් කරන පාර්ශ්වය එකී භාරදීම පිළිබඳව අනෙක් පාර්ශ්වය වෙත කල්වේලා ඇතිව දැනුම් දිය යුතුය.

(2) එක් එක් පාර්ශ්වය විසින් එවැනි භාරදීමක් ප්‍රදානය කිරීම,

(අ) දඩුවම් විඳින තැනැත්තා එම රටේ ම පුරවැසියෙකු නම් ;

(ආ) ඒ ඉල්ලීම එම පාර්ශ්වයේ ස්වෛරීභාවය, ජාතික ආරක්ෂාව, මහජන සාමය හෝ වෙනත් යම් අත්‍යාවශ්‍ය පරමාර්ථයක් උල්ලංඝනය විය හැකි නම්;

ප්‍රතික්ෂේප කළ හැකිය.

14 වන වගන්තිය

පිරිවැය

භාරදීම කරන පාර්ශයේ දේශ සීමාව තුළ දී ඒ භාරදීම කරන පාර්ශ්වය විසින් අනන්‍ය වශයෙන් දරන පිරිවැය හැර, දඩුවම් විඳින තැනැත්තකු භාරදීම හෝ ඒ භාරදීමෙන් පසු දණ්ඩන නියමය තවදුරටත් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දරන යම් පිරිවැයක් භාරදීම ලබන පාර්ශ්වය විසින් දැරිය යුතුය. භාරදීම සඳහා දරනු ලැබූ පිරිවැය සම්පූර්ණයෙන් ම හෝ ඉන් කොටසක් දඩුවම විඳින තැනැත්තාගෙන් හෝ වෙනත් මූලාශ්‍රයකින් කෙසේ හෝ පියවා ගැනීමට භාරදීම ලබන පාර්ශ්වය විසින් අපේක්ෂා කළ හැකිය.

15 වන වගන්තිය

භාෂාව

ඉල්ලීම් සහ ආඛ්‍යාරක ලේඛන ඉංග්‍රීසි භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර සහතික කළ පිටපත් සහිතව ඉදිරිපත් කළ යුතුය.

16 වන වගන්තිය

වෙනත් ජාත්‍යන්තර ගිවිසුම් යටතේ ඇති බැඳීම්

මෙහි පාර්ශ්වකරුවන් පාර්ශ්වයන් වශයෙන් පෙනී සිටින වෙනත් ජාත්‍යන්තර ගිවිසුම් හෝ වෙනත් ගිවිසුම් යටතේ ඒ පාර්ශ්වල අයිතීන් හා බැඳීම්වලට මෙම ගිවිසුමෙන් බලපෑමක් ඇති නොවිය යුතුය.

17 වන වගන්තිය

ආරවුල් නිරාකරණය

(1) මෙම ගිවිසුම අර්ථ නිරූපණය කිරීම, අදාළ කර ගැනීම හෝ ක්‍රියාත්මක කිරීම නිසා පැන නගින යම් කවර ම වූ ආරවුල් අන්‍යෝන්‍ය වශයෙන් විසඳා ගැනීම පිණිස මධ්‍යම බලධාරීන් උත්සාහ කළ යුතුය.

(2) ආරවුල අන්‍යෝන්‍ය එකඟතාව මත විසඳා ගැනීමට මධ්‍යම බලධාරීන්ට නොහැකි වූ අවස්ථාවක, එය රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීම ඔස්සේ විසඳා ගත යුතුය.

18 වන වගන්තිය

දඬුවම් විදින තැනැත්තන් භාර දීම

(1) දඬුවම් විදින තැනැත්තන් භාරදීම කරන පාර්ශ්වය විසින් භාරදීම ලබන පාර්ශ්වය වෙත භාර දෙනු ලැබීම ඒ පාර්ශ්වකරුවන් අතර ඇතිකර ගත් එකඟතාව ප්‍රකාර යම් ස්ථානයක දී සහ යම් වේලාවක දී සිදු කළ යුතුය. භාරදීම කරන පාර්ශ්වයේ සිටින සිරගත වූ තැනැත්තන් භාරදීම සඳහා මෙන් ම භාරදීම කරන පාර්ශ්වයේ දේශ සීමාවෙන් බැහැර වන දඬුවම් විදින තැනැත්තන්ගේ භාරකාරත්වය සඳහා ද භාරදීම ලබන පාර්ශ්වය වගකීමට බැඳී සිටිය යුතුය.

(2) දඬුවම් විදින තැනැත්තන් භාරදීම ඉංග්‍රීසි භාෂාවෙන් පිටපතක් සහිත ලියවිල්ලකින් විය යුතුය.

19 වන වගන්තිය

සංශෝධන

පාර්ශ්වකරුවන්ගේ එකඟතාවය මත මෙම ගිවිසුමට කරන යම් සංශෝධන සහ සුළු වෙනස්කිරීම්, ගිවිසුමේ සඳහන් ආකාරයට ම බලාත්මක විය යුතුය.

20 වන වගන්තිය

අවසානාත්මක විධිවිධාන

(1) මෙම ගිවිසුම එක් එක පාර්ශ්වයේ නීති යටතේ අපරාතුමැතියට යටත් විය යුතුය. මෙම ගිවිසුම බලාත්මක කිරීම පිණිස එළඹීමට නියම කරන නෛතික කාර්ය පටිපාටි සම්පූර්ණ කිරීමෙන් පසු, එක් එක් පාර්ශ්වය ඒ අනෙක් පාර්ශ්වය වෙත වහාම රාජතාන්ත්‍රික මට්ටමින් ලිඛිතව දැනුම් දිය යුතුය. අවසාන දැන්වීමෙන් දෙවන මාසයේ පළමු දිනයේ මෙම ගිවිසුම ක්‍රියාත්මක විය යුතුය.

(2) දින නියමයක් නොමැති කාලසීමාවක් සඳහා මෙම ගිවිසුම බලාත්මකව පැවැතිය යුතුය. එසේ වුව ද, දෙපාර්ශ්වයෙන් යම් කවර ම වූ එක් පාර්ශ්වයක් විසින් ගිවිසුම අවසාන කරන බව ඒ අනෙක් පාර්ශ්වය වෙත ලිඛිතව දැනුම් දී මෙම ගිවිසුම අවසන් කළ හැකිය. එකී දැන්වීම ඒ අනෙක් පාර්ශ්වය වෙත ලැබුණ දින සිට මාස හයකින් (06) ගිවිසුම අවසාන විය යුතුය.

(3) අවසන් කිරීමක් පිළිබඳව කුමක් සඳහන් වුව ද, එකී අවසන් කිරීමේ දිනයට පෙර දඬුවම් විඳින තැනැත්තන් සම්බන්ධයෙන් ඉල්ලීම්වලට මෙම ගිවිසුම තවදුරටත් අදාළ විය යුතුය.

මීට සාක්ෂි පිණිස අදාළ රාජ්‍යයන් විසින් බලය පවරන ලද පහත සඳහන් පාර්ශ්වකරුවන් විසින් විධිමත් පරීදි අත්සන් කරන්නට යෙදුණි.

මෙම ලියවිල්ල වියට්නාම භාෂාවෙන්, සිංහල භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් පිටපත් සහිතව සමාන බලයෙන් සහ ප්‍රතිඵලයෙන් වර්ෂ 2014 ක් වූ අප්‍රේල් මස .....07.....වන දින කොළඹ දී අත්සන් කරන්නට යෙදුණි. අර්ථ නිරූපණයේ දී භාෂා පාඨ අතර අනනුකූලතාවක් මතු වුවහොත්, එවිට ඉංග්‍රීසි භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

වියට්නාම් සමාජවාදී ජනරජය වෙනුවට

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවට

VĂN PHÒNG CHÍNH PHỦ XUẤT BẢN

Địa chỉ: Số 01, Hoàng Hoa Thám, Ba Đình, Hà Nội
Điện thoại liên hệ:
- Nội dung: 080.44417
- Phát hành: 080.48543
Email: congbao@chinhphu.vn
Website: http://congbao.chinhphu.vn
In tại: Xí nghiệp Bản đồ 1- Bộ Quốc phòng

Giá: 10.000 đồng